72851

OL/2021(2022)/44-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

* සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **30** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

* **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

### I කොටස

● අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

**1.** ආංගික අභිනයේ දී ඇස්, ඇහිබැම, තොල් යන ශරීර කොටස් ............................ ලෙස හැඳින් වේ.
(1) අංග (2) ප්‍රත්‍යංග (3) උපාංග (4) අනුඋපාංග

**2.** 'එකැස් බෙරය' යන නමින් හඳුන්වනු ලබන්නේ,
(1) උඩැක්කියයි. (2) දවුලයි. (3) ඩමරුවයි. (4) රබානයි.

**3.** නර්තන ඉතිහාසය හා සබැඳි කරුණු ඇතුළත් කොරවක්ගල සෙල්ලිපිය ...................... යුගයට අයත් වේ.
(1) පොළොන්නරු (2) අනුරාධපුර (3) ගම්පොළ (4) කෝට්ටේ

**4.** 'අද වෙස්සන්තර රාජ පුතා...' යන නාට්‍ය ගීතය සඳහා නර්තන නිර්මාණයේ දී වඩාත් යෝග්‍ය වන්නේ ............................ වේ.
(1) ස්ථිතික චලන සහ සංචාරි චලන (2) රිද්මානුකූල චලන සහ සංචාරි චලන
(3) ස්ථිතික චලන සහ තාලානුකූල චලන (4) අභිචලන සහ තාලානුකූල චලන

**5.** ශ්‍රී ලංකාවට පැමිණි විදේශ ජාතිකයකු වූ ............................ මහනුවර දළදා පෙරහැරේ නැටුම් පිළිබඳ විස්තර සඳහන් කර ඇත.
(1) පාහියන් භික්ෂුව (2) ජෝන් කැලවේ (3) රොබට් නොක්ස් (4) ඉබන් බතුතා

**6.** ශ්‍රී ලංකාවට **ළමා මුද්‍රා නාට්‍ය** කලාවක් හඳුන්වාදීමේ ගෞරවය හිමි වන්නේ ........................ මහත්මියට ය.
(1) මිරැන්ඩා හේමලතා (2) වජිරා චිත්‍රසේන
(3) අංජලිකා චිත්‍රසේන (4) සෝමලතා සුබසිංහ

[දෙවැනි පිටුව බලන්න.

**7.** "සොකරි එන්නී සබයෙන් අවසර ගන් නී
නැටුම් නටන්නී තාලෙට ...................... නී"
(1) රාග කියන් (2) පද අල්ලන් (3) ගීත කියන් (4) ලැම සොලවන්

**8.** කරල් හා අක්යාල වෙන් කිරීමේ චාරිත්‍රය සිදු කරනු ලබන්නේ ............................ ශාන්තිකර්මයේ දී ය.
(1) දෙවොල් මඩුව (2) පහන් මඩුව
(3) කොහොඹා යක් කංකාරිය (4) බලි

**9.** දුටුගැමුණු රජු නළඟනන් පිරිවරා ............................ ධාතු නිධන් කිරීමේ උත්සවයට ගිය බව මහාවංශයේ සඳහන් වේ.
(1) රුවන්වැලිසෑයේ (2) ථූපාරාමයේ (3) අභයගිරියේ (4) මිරිසවැටියේ

**10.** වෙව්ලීම, කඳුළු සැලීම, ලොමුදහගැනීම ආදිය ............................ අභිනයට අයත් වේ.
(1) ආහාර්ය (2) ආංගික (3) සාත්වික (4) වාචික

**11.** සොකරි නාටකයේ 'සොත්තානා' ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) ගුරුහාමිගේ සේවකයා ය. (2) වෙදරාළගේ සේවකයා ය.
(3) වෙදරාළගේ පුත්‍රයා ය. (4) පච්චමීරා ය.

**12.** ශාන්ති දේව්ගෝෂ් විසින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කළ ප්‍රථම නෘත්‍ය (මුද්‍රා) නාට්‍යය වන්නේ,
(1) ශාප් මෝචන් ය. (2) සීතාහරණ ය.
(3) සිරිසඟබෝ ය. (4) ඌර්වෂිජායම් ය.

**13.** මුද්‍රා නාට්‍ය ශිල්පියකු වූ නිමල් වෙල්ගම මහතා විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය දෙකක් වන්නේ,
(1) සාවිත්‍රි හා කුණ්ඩලකේශී ය. (2) රාමසීතා හා විදුර ය.
(3) හිරෝෂිමා හා තම්බපන්නී ය. (4) සැළලිහිණිය හා තිත්ත බත ය.

**14.** ක්‍රෝධභාවය තුළින් නිරූපණය කරන රසය වන්නේ,
(1) අද්භූත රසයයි. (2) භයානක රසයයි. (3) රෞද්‍ර රසයයි. (4) වීර රසයයි.

**15.** කථකලි නර්තන සම්ප්‍රදායට අයත් ඝන සහ අවනද්ධ භාණ්ඩ වන්නේ පිළිවෙළින්,
(1) චෙන්ගිලම් හා එලතාලම් ය. (2) කුම්භු හා එඩැක්කය ය.
(3) එලතාලම් හා චෙන්ඩාව ය. (4) කුම්භු හා මද්දල ය.

**16.** කෝලම් නාටකයේ අපර රංග අතර ජනප්‍රිය රංග දෙකක් වන්නේ,
(1) කරපිට කෝලම හා නාග රාක්ෂ කෝලම ය.
(2) නාග රාක්ෂ කෝලම හා නාග කන්‍යා කෝලම ය.
(3) ගොං කොටි කෝලම හා කරපිට කෝලම ය.
(4) මුදලි කෝලම හා ජස කෝලම ය.

**17.** මනිපුරි නර්තනයේ 'චාලි' අභ්‍යාසවල සුවිශේෂ පද කොටස් හඳුන්වනු ලබන නාමය වන්නේ,
(1) පරෙංගේ ය. (2) පුංග් චෝලම් ය. (3) සංකීර්තන් ය. (4) කර්තාල් චෝලම් ය.

**18.** 
මෙම ඡායාරූපයෙන් දැක්වෙන ජවනිකාවෙහි කාන්තා චරිතය වන්නේ,
(1) පටාචාරා මුද්‍රා නාට්‍යයේ පටාචාරා ය.
(2) කරදිය මුද්‍රා නාට්‍යයේ සිසී ය.
(3) දිට්ඨ මංගලිකා මුද්‍රා නාට්‍යයේ දිට්ඨ මංගලිකා ය.
(4) සත් පත්තිනි මුද්‍රා නාට්‍යයේ කාලි අම්මා ය.

**19.** කථකලි නර්තනයේ වේෂ නිරූපණ ශිල්පියා හඳුන්වනු ලබන්නේ,
(1) පොන්නානී ලෙස ය. (2) සිංකිඩි ලෙස ය.
(3) පත්තුකාරන් ලෙස ය. (4) නටුවනාර් ලෙස ය.

**20.** උඩරට වන්නම් 18ට අමතරව නිර්මාණය වූ වන්නම් වන්නේ,
(1) හංස වන්නම හා සිරිකත වන්නම ය.
(2) මරගත වන්නම හා සමනළ වන්නම ය.
(3) සමනළ වන්නම හා කිඳුරු වන්නම ය.
(4) මහබෝ වන්නම හා තිසරා වන්නම ය.

● **21** සිට **24** දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු පහත දැක්වෙන වගුව ඇසුරෙන් තෝරන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | කඩතුරා කවි | උපත් කවි | කෝල්මුර කවි | ශ්ලෝක |
| 2 | තාලම් කවි | වන්නම් | සවුදම් | ප්‍රශස්ති |
| 3 | ලී කෙළි කවි | සන්න | කලගෙඩි කවි | සැහැලි |
| 4 | කුලු කවි | නමස්කාර | ගොයම් කවි | ඔංචිලි වාරම් |

**21.** අනාසාතාත්මක ගායනා දෙකක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) 1 පේළියේ B හා D ය.
(2) 2 පේළියේ A හා D ය.
(3) 3 පේළියේ B හා D ය.
(4) 4 පේළියේ B හා D ය.

**22.** ශාන්තිකර්ම ගායනා ලෙස නම් කළ හැක්කේ,
(1) 1 පේළියේ A හා C ය.
(2) 2 පේළියේ B හා D ය.
(3) 3 පේළියේ B හා C ය.
(4) 4 පේළියේ B හා D ය.

**23.** මෙහි සඳහන් මෙහෙ ගී දෙකක් වන්නේ,
(1) 1 පේළියේ B හා D ය.
(2) 2 පේළියේ B හා C ය.
(3) 3 පේළියේ A හා C ය.
(4) 4 පේළියේ A හා C ය.

**24.** රාජ අනුග්‍රහයෙන් නිර්මාණය වූ ගායනා විශේෂ වන්නේ,
(1) 1 පේළියේ A හා D ය.
(2) 2 පේළියේ B හා D ය.
(3) 3 පේළියේ B හා C ය.
(4) 4 පේළියේ C හා D ය.

**25.** 'උඩරට නර්තන කලාව' හා 'නෘත්‍ය රත්නාකරය' යන ග්‍රන්ථ රචනා කළ ගත්කතුවරයා වන්නේ,
(1) චාල්ස් ගොඩකුඹුර මහතා ය.
(2) ජේ. ඊ. සේදරමන් මහතා ය.
(3) ඊ. ඒ. දෙල්ගොඩ මහතා ය.
(4) සී. එල්. බී. කපුකොටුව මහතා ය.

**26.** උඩරට, පහතරට හා සබරගමු ශාන්තිකර්මවලට අයත් නර්තන අංග වන්නේ පිළිවෙළින්,
(1) යහන් දැක්ම, තොරන් යාගය හා කෝල්පාඩුව වේ.
(2) මඩුපුරය, තොරන් යාගය හා මුදුන්තාලය වේ.
(3) අස්නෙ, මල් මඩුපුරය හා තොරන් යාගය වේ.
(4) හත් පදය, දුනුමාලප්පුව හා දේවකෝල්පාඩුව වේ.

**27.** කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්තිකර්ම තුනෙහි ම දක්නට ලැබෙන අංග වන්නේ,
(1) හත් පද, කප් සිටුවීම, මඩු පේ කිරීම ය.
(2) දළුමුර පිදීම, කප් සිටුවීම, මඩු පේ කිරීම ය.
(3) මඩු පේ කිරීම, නානුමුර කිරීම, කොලොන්න පද නැටීම ය.
(4) හත් පද පෙළපාලිය, දළුමුර පිදීම, යහන් දැක්ම ය.

**28.** 'නල දමයන්ති' මුද්‍රා නාට්‍යය නිර්මාණය කරන ලද්දේ,
(1) ප්‍රේමකුමාර එපිටවෙල මහතා ය.
(2) ඒ. ඉඹුල්ගොඩ මහතා ය.
(3) ආචාර්ය එස්. පණිභාරත මහතා ය.
(4) ආචාර්ය චිත්‍රසේන ඩයස් මහතා ය.

**29.**



A



B



C

ඉහත A, B, C යන ඡායාරූප මගින් පිළිබිඹු වන 'රස' පිළිවෙළින්,
(1) කරුණ රසය, අද්භූත රසය හා ශාන්ත රසය වේ.
(2) ශෘංගාර රසය, භයානක රසය හා කරුණ රසය වේ.
(3) හාස්‍ය රසය, භයානක රසය හා ශාන්ත රසය වේ.
(4) ශෘංගාර රසය, අද්භූත රසය හා කරුණ රසය වේ.

**30.** වර්තමාන වේදිකාවට ගැළපෙන සේ කථකලි නර්තනය සකස් කළ ශිල්පීන් ලෙස හඳුන්වන්නේ,
(1) කැලිකට්හි සැමෝරින් රජු හා බිර්ජු මහරාජ් ය.
(2) උදය ශංකර් හා රාම් ගෝපාල් ය.
(3) ක්‍රිෂ්නන් නායර් හා කුංජු කුරුප් ය.
(4) චක්කියාර්වරුන් හා වල්ලතෝල්නාරායන මෙනන් ය.

### II කොටස - උඩරට නර්තනය

**31.** "තකට තකට තක තරිකිට කුඳ කුඳ තා තක ජිජි කුද" යන කස්තිරම භාවිත වන ගොඩ සරඹය කුමක් ද?
(1) අටවන ගොඩ සරඹය
(2) නවවන ගොඩ සරඹය
(3) දහවන ගොඩ සරඹය
(4) එකොළොස්වන ගොඩ සරඹය

**32.** කොහොඹා යක් කංකාරියේ දී වාදනයට ප්‍රධාන ස්ථානයක් හිමි වන්නේ,
(1) මඟුල් බෙර හා යක්තුන් පදයේ දී ය.
(2) අත්‍යා බෙර හා හත් පදයේ දී ය.
(3) පින් බෙර හා යක් ඇනුමේ දී ය.
(4) යුගල් බෙර හා මල් හත් පදයේ දී ය.

**33.** ගැට බෙරයේ 'ජිං' අක්ෂරය වාදනය කරන ස්වරූපයෙන් උපදවා ගනු ලබන බීජාක්ෂරය කුමක් ද?
(1) තත්
(2) ජිත්
(3) තොං
(4) නං

**34.** කොහොඹා යක් කංකාරියේ චාරිත්‍ර විධියක් හා ගායනය රහිත නර්තනාංගයක් වන්නේ පිළිවෙළින්,
(1) තොටමෙට යාම හා දුනුමාලප්පුව ය.
(2) හඟල යැදීම හා මඩුපුරය ය.
(3) කප් සිටුවීම හා අස්නෙ ය.
(4) අයිලෙ යැදීම හා හත්පදය ය.

**35.** "කුඳ ගජිගත /// කුඳ තා ..." මෙය,
(1) තනි තිතට අයත් කස්තිරමකි.
(2) තනි තිතට අයත් අඩව්වකි.
(3) දෙතිතට අයත් කස්තිරමකි.
(4) දෙතිතට අයත් අඩව්වකි.

**36.** හඟල, නරු, පොත්පොට යන රංග වස්ත්‍ර අයත් වන්නේ,
(1) වෙස් ඇඳුම් කට්ටලයට ය.
(2) උඩැක්කි ඇඳුම් කට්ටලයට ය.
(3) නයියඩි (නයියන්ඩි) ඇඳුම් කට්ටලයට ය.
(4) පන්තේරු ඇඳුම් කට්ටලයට ය.

**37.** "තා......ම් දොමිතිගත දොමිකිට......." මෙම අඩව්ව නර්තනය කළ හැකි තාල රූප වන්නේ,
(1) සුළු තනි තිත හා සුළු මැදුම් දෙතිත ය.
(2) සුළු තනි තිත හා දෙසුළු මහ තුන් තිත ය.
(3) මහ තනි තිත හා සුළු මහ දෙතිත ය.
(4) මහ තනි තිත හා දෙසුළු මැදුම් තුන් තිත ය.

**38.** ගැටබෙරයෙහි වම් ඇසට හා දකුණු ඇසට යෙදිය හැකි හම් (සම්) පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) එළු හම හා හරක් හම
(2) මුව හම හා බොකු හම
(3) හරක් හම හා වඳුරු හම
(4) හරක් හම හා ගෝණ හම

**39.** "කොහොඹා යක් කංකාරිය හා සමාජය" කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ ය. (2) මහාචාර්ය මුදියන්සේ දිසානායක ය.
(3) මහාචාර්ය තිස්ස කාරියවසම් ය. (4) මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ ය.

**40.** "දොංතකු දොංතකු දොංජිං ගත්තත් ජිං තරිකිට" යන බෙර පදය අයත් තිත් රූපය වන්නේ,
(1) සුළු මැදුම් දෙතිත ය. (2) දෙසුළු මැදුම් තුන් තිත ය.
(3) සුළු මහ දෙතිත ය. (4) දෙසුළු මහ තුන් තිත ය.

## III කොටස - පහතරට නර්තනය

**31.** "ගුහිති ගදිරිකිට ගුඳ ගුඳ ගුදිත ගුදිත් තත් ......" යන ඉරට්ටිය භාවිත වන ඉලංගම් සරඹය කුමක් ද?
(1) අට (2) නවය (3) දහය (4) එකොළහ

**32.** ගායනයට ප්‍රධාන තැනක් ලැබෙන දෙවොල් මඩු ශාන්තිකර්මයේ නර්තන අංගය වන්නේ,
(1) පත්තිනි නැටීම ය. (2) හත්පද පෙළපාලිය ය.
(3) යහන් දැක්ම ය. (4) තොරන් යාගය ය.

**33.** පහතරට බෙරයේ 'ගුම්' අක්ෂරය වාදනය කරන ස්වරූපයෙන් උපදවා ගනු ලබන බීජාක්ෂරය කුමක් ද?
(1) දිත් (2) නං (3) තත් (4) තොං

**34.** දෙවොල් මඩු ශාන්තිකර්මයෙහි චාරිත්‍ර විධියක් හා නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත අවස්ථාවක් වන්නේ පිළිවෙළින්,
(1) හගල යැදීම හා අඹවිදමනයි. (2) කප් සිටුවීම හා වාහල නැටීමයි.
(3) තොටමෙට යාම හා තොරන් යාගයයි. (4) මිල්ල කැපීම හා දෙවොල් ගොඩබැසීමයි.

**35.** "දොම් තත් දිම් ගත ගුගුදිත ........" මෙය,
(1) තනි තිතට අයත් ඉරට්ටියකි. (2) තනි තිතට අයත් අත්තාඩියකි.
(3) දෙතිතට අයත් ඉරට්ටියකි. (4) දෙතිතට අයත් අත්තාඩියකි.

**36.** පබුලු හැට්ටය, තළල් පටිය, අත් පටි යන රංග වස්ත්‍රාභරණ අයත් වන්නේ,
(1) තෙල්මේ ඇඳුම් කට්ටලයට ය. (2) ගිරිදේවි ඇඳුම් කට්ටලයට ය.
(3) දෙවොල් ඇඳුම් කට්ටලයට ය. (4) පත්තිනි ඇඳුම් කට්ටලයට ය.

**37.** "ගුංදත් ගුහිතිගදිරිකිට ගත ගත ......" මෙම ඉරට්ටිය නර්තනය කළ හැකි තාල රූප තෝරන්න.
(1) 1 2 සහ 1 2 3 (2) 1 2 සහ 1 2 3 4
(3) 1 2 3 සහ 1 2 3 4 (4) 1 2 3 සහ 1 2 + 1 2 3 4

**38.** පහතරට බෙරයෙහි වරපටි හා දකුණු ඇසට සුදුසු හම් (සම්) පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) හරක් හම් හා මුව හම් (2) එළු හම් හා බොකු හම්
(3) හරක් හම් හා බොකු හම් (4) මුව හම් හා එළු හම්

**39.** "පහතරට ශාන්තිකර්ම සාහිත්‍ය" කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය මුදියන්සේ දිසානායක ය. (2) මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ ය.
(3) මහාචාර්ය තිස්ස කාරියවසම් ය. (4) මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ ය.

**40.** "දිත් තම් දිතකු දොම් දොම් තාම්" යන බෙර පදය අයත් වන්නේ,
(1) මාත්‍රා 2 + 3 දෙතිතට ය. (2) මාත්‍රා 2 + 2 + 3 තුන්තිතට ය.
(3) මාත්‍රා 2 + 4 දෙතිතට ය. (4) මාත්‍රා 2 + 2 + 4 තුන්තිතට ය.

### IV කොටස - සබරගමු නර්තනය

**31.** "තරිකිට දිරිකිට, දිරිකිට තරිකිට" යන්න කීවෙනි දොඹින පදය ද?
(1) නව වැනි (2) දහ වැනි (3) එකොළොස් වැනි (4) දොළොස් වැනි

**32.** පහන් මඩුවට අයත් ගායනය සහිත නර්තනාංගයක් වන්නේ,
(1) හත් පද පෙළපාලිය ය. (2) යහන් දැක්ම ය.
(3) පන්දම් පද ය. (4) මුගුරු පද ය.

**33.** සබරගමු දවුලේ 'ජෙං' අක්ෂරය කීවෙනි බීජාක්ෂරය ද?
(1) පළමු (2) දෙවන (3) තුන්වන (4) සිව්වන

**34.** පහන් මඩුවේ චාරිත්‍ර විධියක් හා නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත අවස්ථාවක් වන්නේ පිළිවෙළින්
(1) හඟලේ යැදීම හා දෙවොල් ගොඩබැසීමයි. (2) තොටපේ කිරීම හා යහන් දැක්මයි.
(3) අයිලේ යැදීම හා පොත්කඩේ පාලියයි. (4) දළුමුර පිදීම හා අඹ විදමනයි.

**35.** "ජිංත ගත්තත් ගතිත ගතදොම් ......." මෙය,
(1) තනි තිතට අයත් අඩව්වකි. (2) තනි තිතට අයත් කලාසමකි.
(3) දෙතිතට අයත් අඩව්වකි. (4) දෙතිතට අයත් කලාසමකි.

**36.** "නෙත්තිමාලය" යන රංගාභරණය අයත් වන්නේ,
(1) පබුළු ඇඳුම් කට්ටලයට ය. (2) නයියඩි (නයියන්ඩි) ඇඳුම් කට්ටලයට ය.
(3) තෙල්මේ ඇඳුම් කට්ටලයට ය. (4) දෙවොල් ඇඳුම් කට්ටලයට ය.

**37.** "තහර්ද තත් තත්, තතත් තත් තත් ......" මෙම අඩව්ව නර්තනය කළ හැකි තාල රූපය තෝරන්න.
(1) 2 + 2 + 4 (2) 3 + 2 + 2 (3) 4 + 2 + 2 (4) 4 + 3 + 2

**38.** සබරගමු දවුලේ ඉල්ලම් මුදු හා බෙර ඇසට සුදුසු හම් (සම්) පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) හරක් හම් හා බොකු හම් (2) එළු හම් හා වඳුරු හම්
(3) හරක් හම් හා එළු හම් (4) එළු හම් හා හරක් හම්

**39.** "සමන් දේවාල පුද සිරිත්" කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය මුදියන්සේ දිසානායක විසිනි. (2) මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ විසිනි.
(3) මහාචාර්ය තිස්ස කාරියවසම් විසිනි. (4) මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ විසිනි.

**40.** "ජිං කුඳ ජිමිත ගත්තත් තකට" යන බෙර පදය අයත් තිත වන්නේ,
(1) මාත්‍රා 2 + 3 දෙතිත ය. (2) මාත්‍රා 2 + 2 + 3 තුන්තිත ය.
(3) මාත්‍රා 2 + 4 දෙතිත ය. (4) මාත්‍රා 2 + 2 + 4 තුන්තිත ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **12** බැගින් හිමි වේ.

**1.** **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) ලී කැටයමින් කළ නර්තන රූපයක් දැකිය හැක්කේ ................................ දේවාලයේ ය.

(ii) වන්නම්, ප්‍රශස්ති සහ හටන් කවි ගායනා කවිකාර මඩුවේ වඩාත් ප්‍රචලිත වූයේ ................................ රාජ්‍ය සමයේ දී ය.

(iii) කොක්තුම්බි නැමැති හිස් පලඳනාව ............................. නර්තන සම්ප්‍රදායේ දී භාවිත කරයි.

(iv) බෞද්ධාගමික උත්සව අවස්ථාවන්හි කරනු ලබන ................................ නර්තනය පත්තිනි දෙවියන් හා බැඳී පවතින්නකි.

(v) වේදිකා සැරසිලි, ඇඳුම් පැළඳුම් සහ විදුලි ආලෝකය යනාදිය ................................ අභිනයට අයත් වේ.

(vi) කුඩාගුරු සහ මහගුරු යන චරිත දෙක ඇතුළත් නාට්‍යමය ලක්ෂණ සහිත අවස්ථාව දක්නට ලැබෙන්නේ ................................ ශාන්තිකර්මයේ දී ය.

(vii) සරඹ අභ්‍යාස කිරීමේ දී ආරම්භක වේගය හඳුන්වනු ලබන්නේ ................................ ලය වශයෙනි.

(viii) දෙපානෝ ගීත නාටකය ..................................මහතාගේ නිර්මාණයකි.

(ix) පහත සඳහන් නර්තනාංග ඇතුළත් නර්තන සම්ප්‍රදායයන් මොනවා ද?

(අ) කුඩිආට්ටම් - ........................................

(ආ) පරෙංගේ - ........................................

(x) පහත දැක්වෙන මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ කලාකරුවන් නම් කරන්න.

(අ) චන්ඩාලිකා - ........................................

(ආ) දිට්ඨ මංගලිකා - ........................................

**2.** (i) කුඳංත ගත දොම් වට්ටම හෝ ගුඳගතිගත වට්ටම හෝ පට්ටුතල් මාත්‍රයට හෝ අයත් බෙර පදය ප්‍රස්තාර කරන්න.

(ii) "ත්‍රිවිධ ඥාන විදුරු පඬි අපෙ මහ ගෞතම නම් මුනිඳු ඒ බුදු වූ" යන කවි පාදය, අදාළ තිත් රූපයට ප්‍රස්තාර කරන්න.

(iii) වෛරෝඩි වන්නමේ කස්තිරම හෝ ඊශ්වර කුණ්ඩ තාලයේ ඉරට්ටිය හෝ කදම්බපක්ෂි වන්නමේ කලාසම හෝ ප්‍රස්තාර කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) කෝලම් රඟමඬල

(ii) අංග රචනය

(iii) ත්‍රිවිධ ලය

(iv) ටීකා සීපද

(v) වේදිකා ප්‍රසංග

[අටවැනි පිටුව බලන්න.


**4.** ත්‍රිවිධ නර්තන සම්ප්‍රදායයන් හා බැඳි ශාන්තිකර්මවල සංස්කෘතික පසුබිම අධ්‍යයනය කිරීමේ දී එකිනෙකට සමාන ලක්ෂණ පිළිබිඹු වේ.

(i) පහන් මඩුව පැවැත්වීමේ අරමුණු පිළිබඳ විස්තරයක් කරන්න.

(ii) දෙවොල් මඩුවේ භාවිත කරන කාන්තා රංග වස්ත්‍රාභරණ පිළිබඳ පැහැදිලි කරන්න.

(iii) කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මයෙන් සමාජයට ලබාදෙන පණිවිඩය පිළිබඳ විමසීමක් කරන්න.

**5.** පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

(i) A රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර, එහි භාවිත වේශ නිරූපණ ක්‍රම **දෙකක්** හඳුන්වන්න.

(ii) B රූපයෙන් දැක්වෙන මුද්‍රා නාට්‍යය නම් කර, ඒ පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

(iii) C රූපයට අදාළ ජන නාටකය නම් කර, එහි දැක්වෙන කාන්තා චරිතය පිළිබඳ විමසුමක් කරන්න.

**6.** "21 වන සියවසේ දේශීය නර්තන කලාවේ ප්‍රවණතා, ආයතනික මෙන් ම වෘත්තීය මට්ටමින් ද ඉදිරියට ගමන් කොට ඇත." පහත දැක්වෙන කරුණු ඇසුරෙන් ඇගයීමක් කරන්න.

(i) අධ්‍යාපන ආයතන

(ii) වෘත්තීය ගමන් මග

(iii) සන්නිවේදනය

**7.** ශ්‍රී ලාංකේය වාද්‍ය භාණ්ඩ, විවිධ වූ සන්නිවේදන කාර්යභාරයන්ට යොදාගත් බව ඓතිහාසික තොරතුරු මගින් ගම්‍ය වේ.

(i) ආගමික වත්පිළිවෙත්හි වාදන අවස්ථා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(ii) රාජ්‍ය පාලකයන්ගේ කාර්යභාරයන් සඳහා වාදනය යොදාගත් ආකාරය සාකච්ඡා කරන්න.

(iii) වර්තමානයේ සමාජ උත්සව සඳහා වාද්‍ය සන්නිවේදන කාර්යභාරය විමසුමට ලක් කරන්න.

* * *